# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2075/15 - 2018 ජුනි මස 11 වැනි සඳුදා - 2018.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (VI)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ සහ 24ඈ වගන්ති යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24ඇ සහ 24ඈ වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මේ නියමය මගින් -

(අ) මෙහි උපලේඛනයේ විස්තර කර ඇති සීමා තුළ පිහිටි භූමි ප්‍රදේශය ඉහත කී පනතේ කාර්ය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවටත්, එම ප්‍රදේශය ''පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ;

(ආ) මෙම නියමය බලාත්මකව පවතින තාක්කල් -

(i) ඉහත කී පනතේ විධිවිධානවලට පටහැනිව ඉහත කී පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදු කෙරෙන ඕනෑම ආකාරයක සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක්, මෙම නියමය කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වීම අවසන් විය යුතු බවටත් ;

(ii) අධිකාරිය හැර වෙනත් කිසිදු තැනැත්තකු විසින් ඉහත කී පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සීමා ඇතුළත බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටුකිරීම නොකළ යුතු බවටත් ;

(iii) ඉහත කී පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ පවතින භූමි ප්‍රදේශය කිසිදු කටයුත්තක් සඳහා භාවිත කිරීම සම්පූර්ණයෙන් තහනම් බවටත් ;

(ඇ) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත, එනම් -

(i) කමිටුවේ සභාපති ලෙස ක්‍රියාකරනු ලැබිය යුතු අධ්‍යක්ෂවරයකුගේ තනතුරට අඩු නොවන තනතුරක් දරන අධිකාරියේ නියෝජිතයකු ;

(ii) මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නියෝජිතයෙකු ;

(iii) උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නියෝජිතයෙකු ;

(iv) උකුවෙල ප්‍රාදේශීය සභාවේ නියෝජිතයෙකු ;

(v) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(vi) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ;

(vii) වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ;

(viii) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නියෝජිතයෙකු ;

(ix) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ;

(x) ඇල්කඩුව වැව්ලි සමාගමේ නියෝජිතයෙකු ;

(xi) ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින ප්‍රජා මූල සංවිධානයක නියෝජිතයෙකු.

පසු විපරම් කමිටුවක් මගින් පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ පසු විපරම් කටයුතු සිදු කළ යුතු බවට සහ එහි සංරක්ෂණය හා තිරසාර කළමනාකරණය සම්බන්ධයෙන් අධිකාරිය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු බවටත්,

ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ කාර්ය සඳහා ''අධිකාරිය'' යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය අදහස් වේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 ක් වූ ජුනි මස 05 දින,
කොළඹ දී ය.


උපලේඛනය


මෙහි පහත සිතියමේ විස්තර කර ඇත්තා වූ ද, මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොඹගස්දෙනිය E-345A සහ හලංගොඩ E-347A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ පිහිටා ඇත්තා වූ ද, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2014.06.17 දිනැති අංක මා 1620 දරන මිනින්දෝරු පිඹුරේ දක්වා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 103.4614 ක් වූ පන්සලාතැන්න-මාඋස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සමන්විත වන සම්පූර්ණ භූමි ප්‍රදේශයේ මායිම් පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 1, 2 සහ ඇල්කඩුව වැව්ලි සමාගම හිමිකම් කියනු ලබන මාඋස්සාගොල්ල වත්ත ; |
| නැගෙනහිරට | : | කැබලි අංක 2 සහ ඇල්කඩුව වැව්ලි සමාගම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියනු ලබන මාඋස්සාගොල්ල වත්ත ; |
| දකුණට | : | කැබලි අංක 8 සහ ඇල්කඩුව වැව්ලි සමාගම හිමිකම් කියනු ලබන මාඋස්සාගොල්ල වත්ත, කැබලි අංක 7, ඇල්කඩුව වැව්ලි සමාගම හිමිකම් කියනු ලබන පන්සලාතැන්න වත්ත සහ කැබලි අංක 6 ; |
| බටහිරට | : | ඇල්කඩුව වැව්ලි සමාගම හිමිකම් කියනු ලබන පන්සලාතැන්න වත්ත, කැබලි අංක 5, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියනු ලබන පන්සලාතැන්න වත්ත, කැබලි අංක 4. |

**පන්සලාතැන්න-මාලුස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ පිහිටීම.**

| | |
|---|---|
| පළාත | - මධ්‍යම |
| දිස්ත්‍රික්කය | - මාතලේ |
| ප්‍රා.ලේ. කොට්ඨාසය | - උකුවෙල |
| ග්‍රා.නි.කොට්ඨාසය | - දොඹගස්දෙනිය ඊ345ඒ<br>හලංගොඩ ඊ347ඒ |
| වපසරිය | - හෙක්ටයාර 103.4614 |




ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව/ පිඹුරු අංක: මා 1620
දිනය :2014.06.17

06 - 964